Jagath Abeynayaka
Attorney at law

නීතිඥ රජීව් අමරසූරිය මහතා
සභාපති,
ශ්‍රී ලංකා නීතිඥ සංගමය,
කොළඹ 12.

2026.08.10

මහත්මයාණනි,

**විනිසුරුවරුන්ගේ ධූර කාලය දීර්ඝ කිරීම අදාළ සාකච්ඡාවන් හි දී ඇතැම් පාර්ශවයන් විසින් දැනට ධූරය දරණ ගරු අගවිනිසුරුතුමන් පුද්ගලිකව ඉල්ලක කර ගනිමින් ද්වේශ සහගතව ප්‍රකාශයන් සිදු කිරීම සම්බන්ධවයි.**

අධිකරණ කටයුතුවල යෙදෙන සියළු විනිසුරුවරුන්ගේ උපරිම විශ්‍රාම වයස වසර දෙකකින් තීරණය කිරීමට රජය ගෙන ඇති ප්‍රතිපත්තිමය තීරණය මත මේ වන 22වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධන කෙටුම්පත සහ යෝජිත අධිකරණ සංවිධාන සංශෝධන පනත් කෙටුම්පත ගැසට් පත්‍රයේ පළ කර ඇත.

එම යෝජිත පනත් කෙටුම්පත් පාර්ලිමේන්තුවේ න්‍යාය පුස්තකයට ඇතුළත් කළ දින සිට දින 14ක කාලයක් තුළ, එම පනත් කෙටුම්පත්වල ආණ්ඩුක්‍රම ව්‍යවස්ථානුකූලභාවය ප්‍රශ්න කිරීමට අපේක්ෂිත කවර පාර්ශවයකට හෝ ශ්‍රේෂ්ඨාධිකරණය හමුවේ පෙත්සම් ගොනු කිරීමේ අවස්ථාවක් ද පවතී.

යෝජිත සංශෝධන මගින් සියළු විනිසුරුවරුන්ගේ විශ්‍රාම වයස දීර්ඝ කිරීමට කටයුතු කරන පසුබිමක, මෙම සංශෝධන අගවිනිසුරුවරයාට ලබා දෙන සේවා දිගුවක් ලෙස අප සංගමයේ ඇතැම් සාමාජිකයින් ඇතුළු විවිධ දේශපාලනඥයින් විසින් අදහස් දැක්වීම පසු ගිය දිනවල නිරීක්ෂණය වූ අතර, එය සාමාන්‍ය මහජනතාව සහ ගරුතර මහාසංඝරත්නය ඇතුළු පූජ්‍ය පක්ෂය ද නොමඟ යවන සුළු ප්‍රචාරණයක් වන බව මාගේ පුද්ගලික අදහස වේ.

යෝජිත සංශෝධන සම්බන්ධයෙන් පක්ෂව ද විපක්ෂව ද මිශ්‍ර අදහස් සහිතව ද බොහෝ පාර්ශවන් විසින් කරුණු දක්වමින් සිටින අතර, ඔබගේ නායකත්වය යටතේ නීතිඥ සංගමය විසින් එම සංශෝධනවලට විපක්ෂව ප්‍රසිද්ධියේ ස්ථාවරයක් ගෙන ඇත.

කෙසේ නමුත්, මා මෙතෙක් විශ්වාස කරන ලද්දේ ද, මින් ඉදිරියට මා විශ්වාස කරනු කැමැත්තේ ද, මෙම යෝජිත සංශෝධනයන්ට එරෙහිව නීතිඥ සංගමයට පවතින්නේ ප්‍රතිපත්තිමය විවේචනයක් පමණක් වන බවත්, එය හුදෙක්ම වර්තමාන අගවිනිසුරුවරයා සම්බන්ධයෙන් පුද්ගලිකව දක්වන්නා වූ විරෝධයක් නොවන බවයි.

කෙසේ නමුත්, මෑතක දී පාර්ලිමේන්තු වරප්‍රසාද භාවිත කරමින් ඇතැම් විපක්ෂ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සහ මන්ත්‍රීවරියන් විසින් අගවිනිසුරුතුමාව පුද්ගලිකව ඉලක්ක කර ගනිමින් ඉතා පහත් අන්දමේ අවලාද නැගීමක් පිළිබඳ මා නිරීක්ෂණය කරන ලදී.

කෙසේ නමුත්, වෙනත් කවර හෝ අවස්ථාවක ධූරය දරණ විනිශ්වයකාරවරයෙකු පුද්ගලිකව ඉලක්ක කර ගනිමින් මෙවැනි ස්වරූපයේ අවලාද නැගීමක් සිදු වූවා නම්, ශ්‍රී ලංකා නීතිඥ සංගමය විසින් එය

සමස්ත අධිකරණයට සහ නීතියේ ආධිපත්‍යයට කරන ලද බරපතල පහරක් ලෙස බාර ගනිමින් එවැනි ප්‍රකාශ සම්බන්ධයෙන් දැඩි විරෝධයක් දක්වනු ඇති බව මාගේ අදහසයි.

එසේ නමුත්, ධූරය දරණ අගවිනිසුරුවරයා පුද්ගලිකව ඉලක්ක කරගෙන සිදු කරනු ලබන එවැනි ප්‍රකාශ සම්බන්ධයෙන් ශ්‍රී ලංකා නීතිඥ සංගමය ලෙස අප විසින් කිසිදු විරෝධයක් නොදැක්වීම මාගේ දීර්ඝ කාලීන නීතිඥ දිවිය තුළ අපේක්ෂා නොකළ අන්දමේ වාතාවරණයකි.

නීතිඥ සංගමය ලෙස අපගේ එකී අරුත් ගැන්විය නොහැකි දැඩි නිෂ්ශබ්දතාවය හේතුවෙන්, නීතිඥ සංගමය ද එම ප්‍රකාශයන් අනුමත කරමින් ඒවාට අප්‍රකාශිත එකඟතාවයක් දක්වනවා ද යන්න පොදු ජන මනස තුළ චිත්‍රණය වීම වළක්වාලනු නොහැකි වනු ඇත.

අප සාමාජික නීති වෘත්තිකයන් මෙන් ම විනිශ්චයාසනාරූඪ විනිසුරන් කෙරෙහිත් අප සංගමයේ සහායත්, රැකවරණයත්, නියෝජනයත් අවශ්‍ය අවස්ථාවලදී නොපැකිලවත් අපක්ෂපාතීවත් ලබාදීම අප සම්ප්‍රදාය බව ඔබ ඉඳුරාම දැනුවත් කාරණයකි. තවද, අප සංගමයේ වඩාත් මුඛ්‍ය හා ප්‍රකාශිත පරමාර්ථ අතරින් අධිකරණයේ ස්වාධීනත්වය ආරක්ෂා කිරීමට කටයුතු කිරීම, ඉතා ඉහළින් අප විසින් පවත්වාගෙන එනු ලබන සම්ප්‍රදායක් බව ද පැවසිය යුතුය.

විශේෂයෙන් ම, අවලාදාත්මක ප්‍රකාශ මගින් තමාට පෞද්ගලිකවත් අධිකරණ ක්‍රියාවලියට පොදුවේත් සිදුවන හානියට ප්‍රතිචාර දැක්වීමට විනිසුරුවරයෙකුට ඇති නොහැකියාව හේතුවෙන් එබඳු අවස්ථාවලදී අදාළ විනිසුරුවරයා වෙනුවෙන් විශේෂයෙනුත්, අධිකරණයේ ස්වාධීනත්වය වෙනුවෙන් පොදුවේත්, ඉදිරිපත් වී නිසි අයුරු ක්‍රියා කිරීමට කටයුතු කිරීම අප සංගමයේ සම්ප්‍රදාය වන බව අවිවාදාත්මක වේ. ඉහත තතු යටතේ, එකී මෑතක දී සිදු කරන ලද ප්‍රකාශ මගින් වර්තමානයේ ධූරය දරන අගවිනිසුරුවරයාටත්, එකී ධූරයටත්, අධිකරණයටත් සිදුවන බලපෑමට එරෙහිව ඔබ නිසි ක්‍රියාමාර්ගය ගනු ඇතැයි මම උදක්ම අපේක්ෂා කරමි.

ඒකී තත්ත්වය තුළ, අප සංගමය විසින් විනිසුරුවරුන්ගේ විශ්‍රාම වයස දීර්ඝ කිරීම සම්බන්ධ සංවාදයේ දී ද, ඒ සම්බන්ධයෙන් නීතිඥ සංගමය දක්වන විවේචනයේ දී ද, සෑම අවස්ථාවක දී ම සංගමයක් ලෙස වෘත්තීමයභාවය ආරක්ෂා කර ගත යුතු බවත්, මා ද ඇතුළුව අප සංගමයේ බොහෝ සාමාජිකයින්ට පුද්ගලික දේශපාලනික මතිමතාන්තර තිබිය හැකි වුවත්, අපගේ පුද්ගලිකත්වය හෝ ආවේගයන් නීතිඥ සංගමය ලෙස ප්‍රකාශය වීම හෝ ඇතැම් කරුණු සම්බන්ධයෙන් සංගමයක් ලෙස නිහඬව සිටීම මත ම යම් අදහසක් සමාජයට අප්‍රකාශිතව ඒත්තු ගැන්වීමට ද හැරීම සංගමයේ ගෞරවයට සහ පිළිගැනීමට ඉතා හානිදායක වනු ඇති බව මාගේ අදහස යි.

එකී තත්ත්වය තුළ, ඉදිරි විධායක කමිටු රැස්වීමක දී ශ්‍රී ලංකා නීතිඥ සංගමයේ විධායක කමිටු සාමාජිකයෙකු ලෙස මා නගනු ලබන මෙම කරුණු සම්බන්ධයෙන් සාකච්ඡා කිරීමට අවස්ථාවක් සලසා දෙන ලෙස මා ඔබගෙන් ඉල්ලා සිටිමි.

මෙයට,
විශ්වාසී,

**_Residence_**
_32/2, Melfort Estate,_
_Kothalawala, Kaduwela_ email : jagath_abeynayaka@yahoo.com
_Tel: 0714090321_